කම්පනය හෝ හිත් වේදනා ඇති කරනා ආකාරයේ සමාජ ප්‍රශ්න, එනම් කෲරත්වය, ප්‍රචණ්ඩත්වය යනාදිය වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප අවශ්‍ය සංවේදීතාවයෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම, පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්වද ඉදිරිපත් කිරීමට ජනමාධ්‍ය විශේෂයෙන් සැලකිලිමත් විය යුතු බව, ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් ඉදිරිපත් කළ වෘත්තිය ප්‍රතිපත්ති මාලාවේ දැක්වේ.

සංවේදී ඡායාරූප පළ කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර ජනමාධ්‍ය ආචාර ධර්මයන් තුළද මේ හා සමානව අදහස් දැක්වේ. ඒ අනුව වැවේ තිබී සොයාගත් මළ සිරුරක් වැන්නක ඡායාරූපයක් පුවත සමග පළ කිරීම කෙතරම් යෝග්‍ය වේදැයි කරුණු විභාග කිරීමේදී, එම අවශ්‍ය සංවේදීතාවය සහ විචාර බුද්ධියත්, එය පොදුජන ලැදියාවට කෙතරම් අදාළද යන්නත් සැලකිය යුතු වේ.

මේ අනුව පාඨකයන් ලෙසින් අපට පහත ප්‍රශ්න ඇසීමට හැක. මෙම ඡායාරූපය මගින්, ප්‍රවෘත්තියට එහා ගිය යම් කිසි පුළුල් කතිකාවක්, අදහසක් ඉදිරිපත් කෙරෙන්නේද? එම ඡායාරූපය පළ කිරීම පොදුජන ලැදියාවට අදාළ වන්නේද? ඉහත කිසිදු කරුණකට එම ඡායාරූපය වලංගු නොවන්නේ නම්, මේ ආකාරයේ පාඨක කොටසකට හෝ සංවේදී ඡයාරූපයක් පළ කිරීම අවශ්‍ය වන්නේ කෙසේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #News #Aruna